# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2322/37 - 2023 මාර්තු මස 08 වැනි බදාදා - 2023.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) වගන්තිය යටතේ මා විසින් පළ කරන ලද අංක 2317/11 හා 2023.01.30 වැනි දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* සඳහන් කළ පරිදි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 වැනි දින නොපැවැත්වෙන බව ද,

මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන එකී ඡන්ද විමසීමේ දිනය කල් දැමීමට සිදු වී ඇති බැව් මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව එකී කොමිෂන් සභාව විසින් මා හට උපදෙස් දී ඇති හෙයින් ද,

එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 වැනි දිනය මවිසින් මෙයින් නියම කරන බව ද,

(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 38(3) උප වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**අම්බලවාණර් සිවබාලසුන්තරන්,**
තේරීම්භාර නිලධාරි,
යාපනය පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මාර්තු මස 08 වැනි දින,
යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 39055 — 31 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

යාපනය මහා නගර සභාව
වැල්වෙට්ටිතුරෙයි නගර සභාව
පේදුරුතුඩුව නගර සභාව
චාවකච්චේරි නගර සභාව
කාරෙයිනගර් ප්‍රාදේශීය සභාව
කයිට්ස් ප්‍රාදේශීය සභාව
ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව
වෙලනෙයි ප්‍රාදේශීය සභාව
වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව
වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව
වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව
වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව
වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව
වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව
පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව
චාවකච්චේරි ප්‍රාදේශීය සභාව
නල්ලූර් ප්‍රාදේශීය සභාව

EOG 03 - 0095

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.